VERITÉ
විදසුන්

Originally Published in: [Mawbima, December, 2014]

# සැබෑ වියදම් සහ මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම අතර නොගැළපුම

## කෘෂි සහ ආරක්ෂක අය වැය මගින් **හෙළිවන සැඟවුණු** ප්‍රතිපත්ති ප්‍රමුඛතා

**රටක** අය වැය මගින් කෙටි කාලින සහ දිගු කාලින **රාජ්‍ය** මුල්‍ය ප්‍රතිපත්ති රාමුවක් **පෙන්වා දිය යුතුය;** එනම්, රජය මගින් ධනය රැස් කරන ආකාරයත්, එම ධනය බෙදා වෙන් කරනු ලබන ආකාරයත්, වියදම් කරනු ලබන ආකාරයත් විස්තර කිරීම තුළිනි.

රජය විසින් වෙන් කරනු ලබන වියදම් - **එනම්** රජය විසින් වියදම් කිරීමට බලාපොරොත්තු වන ප්‍රමාණය- සහ සැබෑ වියදම් අතර ක්‍රමික සහ සැලකිය යුතු තරමේ විෂමතාව නිරීක්ෂණය කිරීම තුළින් මෙම විශ්ලේෂණය සඳහා අභිප්‍රේරණය ඇති විය. මෙම විෂමතාවන් රජයේ සැබෑ ප්‍රමුඛතාවන් හඳුනා ගැනීමට යොදා ගත හැකි අතර, ඒවා ප්‍රකාශයට පත් කරන ලද ප්‍රමුඛතාවන්ගෙන් වෙනස් වෙයි.

## **හිගය මගින් හෙළිවූ කප්පාදු කිරීම්**

පශ්චාත් යුධ සමයේ රජයේ වඩාත් කැපී පෙනෙන **රාජ්‍ය** මුල්‍යමය ජයග්‍රහණය වූයේ අය වැය පරතරය පියවා ගැනීම සඳහා වූ කැප වීමයි. අය වැය පරතරය 2009 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.9 ක ප්‍රතිශතයේ සිට 2013 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.8 දක්වා අඛණ්ඩව පහත වැටුණි.

කෙසේ වෙතත්, මීට සමාන්තරව, රජයේ විශාලතම **රාජ්‍ය මුල්‍යමය** (fiscal) බිඳවැටීම වූයේ අදායම වැඩි කරගැනීමට නොහැකි වීමයි. රජයේ ආදායම 2009 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.6 ක ප්‍රතිශතයේ සිට 2013 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.1 දක්වා වූ ඓතිහාසික පහත වැටීමකට ලක්විය.

අයවැය පරතරය හා සමඟම ආදායම අඩුකිරීම **හේතුවෙන්** ළඟා කරගත් ජයග්‍රහණයේ පීඩාව **වූයේ,** වියදම් වඩාත් තියුණු ලෙස කප්පාදු කිරීමට සිදු **වීමයි.** කුමන වියදම් අඩු කළ යුතුද, කුමන වියදම් වැඩි කළ යුතුද යන තීරණය මගින් රජයේ සැඟවුණු ප්‍රමුඛතා හෙළි වෙයි.

## දේශපාලන අතිශෝක්තිය සහ අය වැය යතාර්ථය

රජයේ දේශපාලන ප්‍රලාපය, ගොවියා සමාජයේ පදනම ලෙස මූර්තිමත් කිරීමේ දේශීය සවිඥානකතාව සහ සඟ,වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය මත ගොඩනැගුනු සිංහල සංස්කෘතික සංජානනය කෙරෙහි වඩාත් යොමු වී තිබුණි.


මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳ ප්‍රකාශිත දේශපාලන අතිශෝක්තින්ගෙන් සමහරක්, අය වැය ප්‍රමුඛතා මගින් පිළිබිඹු විය. නමුත් සැබෑ වියදම් රටාවන් මීට හාත්පසින්ම වෙනස් වන අතර, ප්‍රකාශිත ප්‍රමුඛතාවන්ට වඩා සැබෑ ප්‍රමුඛතාවන් වෙනස් බව පෙනී යයි. කෘෂි සහ ආරක්ෂක අය වැය සම්බන්ධයෙන් ප්‍රකාශිත සහ සැබෑ වියදම් සසදා බලූ විට මෙය අනාවරණය වෙයි.

අදාළ අමාත්‍යංශවල මුල්‍ය ප්‍රතිපාදන සංයුතිය සහ ප්‍රතිපාදන වියදම්කළ ආකාරය තුළ, කාලානුරූපී වෙනස පිළිබඳ තොරතුරුවල **ඒකමිතිකබව** තහවුරුකර ගැනීම සඳහා අමාත්‍යංශ ප්‍රතිපාදන වෙනුවට, මහබැංකුවේ **කාර්‍ය සාධක** වර්ගීකරණය සම්බන්ධ දත්ත යොදා ගන්න ලදී.

## කෘෂි ප්‍රතිපාදන වෙන් කිරීම් සහ සැබෑව; පරස්පර මාවත්

රජයේ දේශපාලන අතිශෝක්තීන් විසින් කෘෂිකර්මාන්තය, ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටිය වශයෙන් හඳුන්වනු ලබන අතර ග්‍රාමීය අදායම් වැඩි කිරීම සහ රට තුළ පවතින ආදායම් විෂමතාව අඩු කිරීම සඳහා කෘෂිකර්මාන්තයට සහ වාරි මාර්ග සඳහා ආයෝජනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. 2015 වර්ෂයේ අයවැය කතාව තුළ, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් අපගේ ග්‍රාමීය කේන්ද්‍ර සංවර්ධන උපාය මාර්ග, ආහාර සුරක්ෂිතතාව සහ ග්‍රාමීය ජනතාවට වැඩි ආදායම් ලබා දීම අරමුණු කරගත යුතුයී යන්න ප්‍රකාශ කරමින්, මෙම අභිමතාර්ථය පුනරුච්ඡාරණය කළේය.

මෙම දේශපාලන ප්‍රලාපය, අය වැය වාර්තාවන් තුළ **ප්‍ර**කාශයට පත් කරන ලද මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේ ආකාර සමඟ සමපාත විය. සෑම පශ්චාත් යුධ අයවැයක් මගින්ම, කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා වෙන්කරන ලද මුල්‍යමය ප්‍රතිපාදන වර්ධනීය ලෙස විශාල විය. 2013 වර්ෂයේ වෙන්කරන ලද මුල්‍ය ප්‍රතිපාදන 2010 වර්ෂයේදී වියදම් කරන ලද ප්‍රමාණයට **වඩා** සියයට 60 ක ප්‍රතිශතයකින් විශාල වූ අතර 2014 වර්ෂයේදී එය 2010 වර්ෂයේ වියදම්කළ ප්‍රමාණය මෙන් දෙගුණයකි. නමුත්, සැබෑ වියදම් වල ආකාරය මීට වඩා වෙනස් වෙයි. 2013 වර්ෂයේදී, සැබෑ කෘෂි සහ වාරි වියදම් 2010 වර්ෂයේ වියදම්කළ ප්‍රමාණයට වඩා 3% කින් අඩු වී ඇත. 2010 වර්ෂයේ 2013 වර්ෂය වන විට 60% කින් වර්ධනය වූ මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම් වලට පරස්පර ලෙස, එම කාල පරාසය තුළ 3% කින් අඩු වූ සැබෑ වියදම් තුළින්, මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳ දේශපාලන ප්‍රලාපයේ සහ ශ්‍රී ලංකා අයවැය උපයෝගිතාව අතර පවතින්නා වූ දැවැන්ත පරස්පරතාව පෙන්නුම් කරයි.





මූලාශ්‍රයඃ වියදම් පිළිබඳ කෘත්‍යාත්මක වර්ගීකරණය, පරිච්ඡේදය 6, වාර්ෂික මහා බැංකු වාර්තාව (විවිධ වර්ෂ) (2013 - **ඇස්තමේන්තු අගය**) වෙරිටේ පර්යේෂණ විශ්ලේෂණ

**වෙන්කිරීම් සමග සමානුරූපිව,** ආරක්ෂක වියදම්

පශ්චාත් යුධ දේශපාලන ප්‍රලාප මගින් සොල්දාදුවාගේ ප්‍රතිරූපය උත්කර්ෂයට නංවන ලදී (සමහර විට එය, ගොවියා මතින් විය හැකිය). දේශපාලන ප්‍රලාපය සමඟ, යුද්ධයෙන් පසු **ආරක්ෂක** වියදම අඩු කිරීම පිළිබඳ වූ ඇති මහත් මහජන බලාපොරොත්තු නොසළකා හරිමින්, ආරක්ෂාව සඳහා වූ මූල්‍යමය ප්‍රතිපාදන වඩාත් නිත්‍ය ලෙස වර්ධනය විය.

2010 වර්ෂයේ සැබෑ වියදම් සමඟ සංසන්දනය කරන විට, 2012 වර්ෂයේ ආරක්ෂක ප්‍රතිපාදන 14% කින්ද, 2013 වර්ෂයේදී 37% කින්ද, 2014 වර්ෂයේදී 26% කින්ද වැඩි කරන ලදි. සැබෑ වියදම්, නියත උඩුකුරු වර්ධනයක් පෙන්වන ලදි. එය 2012 වර්ෂයේදී 12% කින් වර්ධනය වූ අතර, 2013 වර්ෂයේදී 17% කින් වර්ධනය විය (ii ප්‍රදර්ශකය බලන්න).

එබැවින්, යුධ සමයේදී සිදු වූ ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් පාදක රේඛීය (Base line) අයවැය දැනටමත් ඉතා විශාලව තිබියදීත් කෘෂිකර්මය සඳහා වූ වියදම් ඇණහිටීම සහ අඩුකිරීම සිදු වුවත්, ආරක්ෂක වියදම් අඛණ්ඩ ලෙස වර්ධනය විය.




මූලාශ්‍රයඃ වියදම් පිළිබඳ කෘත්‍යාත්මක වර්ගීකරණය, පරිච්ඡේදය 6, වාර්ෂික මහ බැංකු වාර්තාව (විවිධ වර්ෂ) (2013 - **ඇස්තමේන්තු අගය**) වෙරිටේ පර්යේෂණ විශ්ලේෂණ

කෘෂිකර්මාන්තය මතින් රාජ්‍ය ආරක්ෂාව


අය වැය වාර්තා සහ සැබෑ වියදම් අතර පවතින විශාල විෂමතාව හේතුවෙන්, රජයේ වියදම් ප්‍රමුඛතා වටහාගත යුත්තේ, පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරනු ලබන දේට වඩා, වියදම් සැබවින්ම සිදුවන ආකාරය නිරීක්ෂණයෙනි.

පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරනු ලබන දෙය සහ සැබෑ වියදම් අතර පරතරය, iii වන ප්‍රදර්ශකය මගින් දැක්වේ. කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන සහ සැබෑ වියදම් අතර පරතරය 2010 වර්ෂයේදී 9% ක සිට, 2013 වර්ෂය වන විට 67% දක්වා වර්ධනය වී ඇත. නමුත්, ආරක්ෂක වියදම් සලක බැලීමේදී, 2013 වර්ෂයේදී සිදී වූ 17% ක හදිසි අඩු වීම හැරුණු විට (මෙය තවමත් කෘෂි ප්‍රතිපාදන සහ

සැබෑ වියදම් අතර පරතරයට වඩා අඩුය) ආරක්ෂක ප්‍රතිපාදන බොහෝ දුරට සැබෑ වියදම් සමඟ සමපාත විය.

2010 වර්ෂයේ සිට, කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා කරන ලද වියදම් නිශ්චිතවම අඩු වූ අතර ආරක්ෂක වියදම් 50% සිට 40% දක්වා පහත වැටුණි. කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා වූ ප්‍රමුඛතාව ඌන කිරීම තුළ වක්‍ර ප්‍රතිඵල ඇති කරන ලදී. කෘෂි අංශය, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් තුනෙන් එකකින් සමන්විත වන අතර, ග්‍රාමීය ආර්ථිකය සහ අවස්ථා මෙය මත පදනම්ව ඇත.

රජය, **අය වැය** පරතරය පියවීමේ වැදගත් අභිමතාර්ථය සඳහා කැපවී ඇත. කෙසේ වෙතත්, ආදායම් අඩු වී ඇති අවස්**ථාවක**, මූල්‍ය පරතරය අඩු කිරීම සඳහා වියදම් කපා හැරිය යුතු වෙයි. අදාළ කප්පාදු කිරීම් සහ අය වැය වාර්තා විස්තාරණය වීම විභාගකර බැලීමෙන් පෙනී යන්නේ, සැබෑ ප්‍රමුඛතාව ලබා දිය යුතු කෘෂිකර්මාන්තය නොසළකා හැර ඇති බවත් රාජ්‍ය ආරක්ෂාව සඳහා විශාල අනුග්‍රහයක් දක්වා ඇති බවත්ය. සැළසුම් කරනලද වියදම් සහ සැබෑ වියදම් අතර විෂමතාව මගින්, රජයේ සැබෑ ප්‍රමුඛතාවන්, ප්‍රකාශයට පත කරන ලද ප්‍රමුඛතවන්ගෙන් වෙනස් බව පෙනී යයි.




මූලාශ්‍රයඃ වියදම් පිළිබඳ කෘත්‍යාත්මක වර්ගීකරණය, පරිච්ඡේදය 6, වාර්ෂික මහා බැංකු වාර්තාව (විවිධ වර්ෂ) (2013 - **ඇස්තමේන්තු අගය**) වෙරිටේ පර්යේෂණ විශ්ලේෂණ